**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**<u>මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන</u>**

**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා</u>**

**<u>අයදුම්පත් කැඳවීම - 2025</u>**

මහනුවර මහා නගර සභාවේ විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට 2025.05.15 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරාලන ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම් -**

**1.1. පොදු සුදුසුකම්**

1.1.1. අයදුම්කරු/ අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2. <u>අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට</u> පූර්වාසන්නයෙන් වූ වසර 03 කට නොඅඩු කාලයක් මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

1.1.3. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.4. සෑම අයදුම්කරුවකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

1.1.5. 2025.05.15 දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි අයකු විය යුතුය. (ඒ අනුව 2000.05.15 දිනට හෝ ඊට පෙර, 1980.05.15 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. දැනටමටත් පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**1.2. අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

**1.3 පළපුරුද්ද -**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම

**සටහන : ඉහත උපාධිය හෝ අනෙකුත් සුදුසුකම් 2025.05.15 දිනට හෝ ඊට පෙර දිනක සපුරා තිබිය යුතුය.**

**02. වැටුප් ගෙවීම -**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL 1- 2025 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නීති නිලධාරී තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 82, 150 – 10 x 2,400 – 8 x 2,940 – 17 x 3,900 – 195,970/-

**03.** **සේවා කොන්දේසි -**

3.1.මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

3.3. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.11.18 දිනෙන් අනුමත කර ඇති මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියෙහි සඳහන් කර ඇති හා මින්මතු සිදුකෙරෙන සංශෝධනයන් සඳහා යටත් වනු ඇත.

**04.** **බඳවා ගැනීමේ ක්‍රමය -**

4.1 අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියට අනුව ලකුණු පිරිනමා, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**05.** **අයදුම් කිරීමේ ක්‍රමය.**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, " **ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර** " යන ලිපිනයට 2025.08.15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, නීති නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා අයදුම්පත් යොමු කිරීම "** යනුවෙන් සඳහන් කළ යුතුය.

- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් , අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.
(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**06.** සියළුම අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා බලා තේරුම්ගත යුතුය.

**07.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**08.** මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

2025 ජූනි මස **24** වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

සුජානි ආර්. විජේතුංග,
ලේකම්(වැ.බ),
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.